Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර් තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය:- :- ගණිතය

සතිය- 1 (3 වාරය)

ශ්‍රේණිය:- 8

සැකසුම :- ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය

(ඉගෙනුම් කාලය :- පැය 2 )

## <u>පරිමාව හා ධාරිතාව</u>

22.1 පරිමාව

- 7 ශ්‍රේණියේදී පරිමාව පිළිබඳව ඔබ උගත් කරුණු සිහිපත් කර ගන්න.
- යම්කිසි වස්තුවක් අවකාශයේ පිහිටීම සඳහා අවශ්‍ය ඉඩ ප්‍රමාණය එම වස්තුවේ පරිමාව ලෙස හඳුන්වනු ලැබේ. ඝන සෙන්ටිමීටරය සහ ඝන මීටරය යනු පරිමාව මැනීම සඳහා භාවිත කරන ඒකක දෙකකි.
- පැත්තක දිග 1cm ක්වූ ඝනකයක පරිමාව ඝන සෙන්ටිමීටර එකකි (1 $cm^3$).
- පැත්තක දිග 1m ක්වූ ඝනකයක පරිමාව ඝන මීටර එකකි (1 $m^3$).
- පෙළපොතේ (2 කොටස) 79 පිටුව අධ්‍යයනය කර පුනරීක්ෂණ අභ්‍යාසය කරන්න.

22.2 ඝනකයක පරිමාව හා ඝනකාභයක පරිමාව සඳහා සූත්‍ර

- දිග ඒකක a, පළල ඒකක b සහ උස ඒකක c වූ ඝනකාභයක පරිමාව ඝන ඒකක V නම්, ඝනකාභයේ පරිමාව සඳහා සූත්‍රයක් ලබා ගනිමු.




ඝනකාභයේ පරිමාව = දිග x පළල x උස

$V = a \times b \times c$

$V = abc$

- ඝනකාභයේ (දිග x පළල) මගින් පතුලේ වර් ගඵලය ලැබෙන බැවින් ඝනකාභයේ පරිමාව සඳහා සම්බන්ධතාවය පහත දැක්වෙන ආකාරයටද ලිවිය හැකිය.

  ඝනකාභයේ පරිමාව = පතුලේ වර් ගඵලය x උස

- පැත්තක දිග ඒකක a වූ ඝනකයක පරිමාව ඝන ඒකක V නම්, $V = a^3$ වේ.

  ඝනකයක පරිමාව = පැත්තක දිග x පැත්තක දිග x පැත්තක දිග

- 80,81 හා 82 පිටු අධ්‍යයනය කර 22.1 අභ්‍යාසය කරන්න.